**විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය**
**விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சு**
**Ministry of Science, Technology & Research**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | TR/2/12/VRC/ආරක්ෂාව | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2019.03. 7 |

අභ්‍යන්තර චක්‍රලේඛ: 01/2019

සියළුම විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්

<u>විදාතා සම්පත් මධ්‍යස්ථානයන්හි මුරකරුවන්ගේ රාජකාරී වේලාවන්</u>

විදාතා මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුරකරුවන් සඳහා අදාල රාජකාරී හා රාජකාරී වේලාවන් පහත පරිදි වේ.

I. මුරකරුවන් සතියකට දින 06ක් සේවයට යටත් වන අතර ඉරිදා දින හා රජයේ නිවාඩු දින සාමාන්‍ය රාජකාරි දිනයන් ලෙස සැලකිය යුතුය. ඔවුන්ට සතියකට එක් දිනක් විවේක දිනයක් ලෙස හිමි වේ.

II. එක් සේවා මුරයක රාජකාරි කාලය පැය 09ක් විය යුතු අතර දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ ආසන්නතම අධීක්ෂණ මාණ්ඩලික නිලධාරියාට හෝ සිය අභිමතය පරිදි පැය 12ක උපරිමයකට යටත්ව එක් සේවා මුරයක රාජකාරි වේලාව නියම කළ හැකිය.

III. අතිකාල දීමනා ලබා දිය හැක්කේ එක් සේවා මුරයක් තුළ පැය 09න් ඔබ්බට කරනු ලබන සේවය සඳහා පමණි. මාසික උපරිම අතිකාල පැය ගණන පැය 78 කි.

IV. පැය 12 ඉක්මවා මුරකරුවන් සේවයේ යෙදවීම වැලැක්වීම සඳහා මුරසේවයේ යෙදීමට කැමති කනිෂ්ට නිලධරයන් සිටින විදාතා සම්පත් මධ්‍යස්ථානයන්හි පමණක්, අත්‍යවශ්‍ය රාජකාරී සඳහා සීමා වන සේ යොදා ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ ආසන්නතම අධීක්ෂණ මාණ්ඩලික නිලධාරියාට හෝ කටයුතු කළ හැකි අතර අවශ්‍ය අවස්ථාවලදී ඔවුන්ගේ නිත්‍ය තනතුරෙහි රාජකාරි කාලය පදනම් කරගනිමින් අතිකාල දීමනා ලබා දිය හැකිය.

V. මුරකරුවන්ගේ අතිකාල දීමනා සඳහා ගාස්තු ප්‍රමාණය ගණනය කිරීමේදී ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 6:1 උප වගන්තියෙහි විධිවිධාන අදාළ කරගත යුතුය.

VI. මුරකරුවන් විදාතා සම්පත් මධ්‍යස්ථානයේ දෛනිකව පැය 12 ක සේවා මුරයක යෙදිය යුතු වන බවත්, කාර්යාල භූමියේ ආරක්ෂාව මෙන්ම සියලු දේපළවල ආරක්ෂාව සැපයිය යුතු අතර සේවා මුරය තුළ එම දේපලවලට යම් හානියක් සිදුවුවහොත් ඒ පිළිබඳව වගකීමට බැඳී සිටින බවත් දැනගත යුතුය.

චින්තක එස්. ලොකුහෙට්ටි
ලේකම්
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

පිටපත් : අතිරේක ලේකම් (තාක්ෂණ පැවරුම්) - කරු අ.ක.ස
ප්‍රධාන ගණකාධිකාරී - කරු. අ.ක.ස.
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කරු අ.ක.ස

3 වන මහල, "සෙත්සිරිපාය" 1 වන අදියර, බත්තරමුල්ල - 3ஆம் தளம், "செத்சிறிபாய" கட்டம் I, பத்தரமுல்லை. - 3rd floor, "Sethsiripaya" Stage I, Battaramulla.

ගරු අමාත්‍යතුමා / கௌரவ. அமைச்சர் / Hon Minister: ✆ (+9411) 2186152/ 2 186034, ⎙ (+9411) 2187153, ✉ ss.@sujeewasenasinghe.lk
ලේකම් / செயலாளர் / Secretary: ✆ (+9411) 2784811, ⎙ (+9411) 2785162, ✉ sec@mostr.gov.lk
කාර්යාලය / காரியாலயம் / Office: ✆ (+ 9411) 2879410, ⎙ (+ 9411) 2879412, www.mostr.gov.lk